ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2021 - 11 - 29

පැමිණිලි පාර්ශවය : ලොකු බණ්ඩා රාජකරුණා මයා.
ඉුස්තව.
නැගම්පහ. (අනුරාධපුර)

වගඋත්තරකාර පාර්ශවය : 01. අධ්‍යක්ෂ ජනරාල්.
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව.
මාලිගාවත්ත.
කොළඹ 10.

02. දිස්ත්‍රික් ලේකම්.
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය.
අනුරාධපුර.

03. ප්‍රාදේශීය ලේකම්.
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය.
ඉපලෝගම.

04. ලේකම්.
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශය.
ටොරින්ටන් චතුරශ්‍රය.
කොළඹ 07.

පැමිණිලි අංකය : එච්.ආර්.සී/ජේපී/412/2014

**පැමිණිල්ලේ කරුණු දැක්වීම :**

විශ්‍රාම වැටුප අහිමි කර තිබීම මත පැමිණිල්ල ගොනු කර ඇත. විශ්‍රාම වැටුප ලබාගැනීම පැමිණිල්ලේ ඉල්ලා ඇති සහනය වේ. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2004 හි 03 වන ඡේදය ප්‍රකාරව පැමිණිලිකරුට හිමිවියයුතු විශ්‍රාම වැටුප අහිමි කර තිබීම මත බොහෝ රාජ්‍ය ආයතන ගණනාවක් වෙත කළ ඉල්ලීම්



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541 / 74
ඊමේල් / மின்னஞ்சல் / E-mail: sechrc@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone: 94-11-2505580 / 81 / 82
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

/අභියාචනා/සැලකිරීම් අනුව තම සහනය නොලැබීම මත මෙම පැමිණිල්ල පළමුව අනුරාධපුර මානව හිමිකම් කොමිෂන් සභාවේ ප්‍රාදේශීය කාර්යාලය හමුවේ ගොනු කර තිබී ඇත. තම කරුණ තහවුරු කිරීමට අදාල බොහෝ ලේඛන පැමිණිල්ල සමග අමුණා ඇති බවද පෙනී යන අතර පැමිණිල්ල ගොනු කරන ලද අවස්ථාවේ අවුරුදු 86ක් වූ ජ්‍යෙෂ්ඨ පුරවැසියෙකු වන පැමිණිලිකරු තම ඉල්ලීම ජනාධිපති හා අගමැති ඇතුළු තවත් බොහෝ රාජ්‍ය නායකයින්, ආයතන හා අදාල වන ස්ථාන වෙත යොමු කළද විවිධ විමර්ශන පැවැත්වූ නමුත් සහන නොලද බැවින් කරන ඉල්ලීමක් බවද දක්වා තිබේ.

**වගඋත්තරකරුවන්ගේ කරුණු දැක්වීම :**

අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් විසින් 2020.04.20 දින තම වාර්තාවක් අනුරාධපුර මානව හිමිකම් කොමිෂන් සභාවට ලබාදී ඇත. ඉන් දක්වා ඇත්තේ පැමිණිලිකරු 1960 වසරේදී මහ මැතිවරණය සඳහා ඉදිරිපත් වී රාජ්‍ය සේවයෙන් ඉල්ලා අස් වූ බවද අඛණ්ඩ රාජ්‍ය සේවය අවුරුදු 11 මාස 11 දින 12ක් බවය.

පැමිණිලිකරු අවසන් වරට සේවය කළ ඉපලෝගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පැමිණිලිකරුගේ පුද්ගලික ලිපි ගොනුව හීෂණ සමයේ වූ ගිනි තැබීම් වලින් විනාශ වී ඇති බවද

විශ්‍රාම වැටුපක් පැමිණිලිකරුට ලබා දීම සම්බන්ධව විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් සහ රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම් වෙතින් ලිඛිතව විමසීම් කළ බවද

අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කර, නාවික මාසික විශ්‍රාම වැටුපක් ලබාදීමට විමසීමට විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් ක්‍රියා කර ඇති බවද

ඒ අනුව රු.75,000/-ක් පමණක් ගෙවා සානුකම්පිත දීමනාවක් එක්වරක් පමණක් ගෙවීමට අමාත්‍ය මණ්ඩලය තීරණය කර තිබූ බවද

එයට එකග නොවූ පැමිණිලිකරු තම විශ්‍රාම වැටුප රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 07/2004 ප්‍රකාරවම ඉල්ලා අභියාචනා කළද එය ප්‍රතික්ෂේප වී ඇති බවද දක්වා සිටී. රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ වාර්තාවක් මගින් කොමිෂන් සභාව වෙත දක්වා ඇත්තේ,

1948-1960 කාලය තුළ පැමිණිලිකරු රජයේ ලිපිකරු සේවයේ රාජකාරි කර ඇති බවද 1960 පාර්ලිමේන්තු මහ මැතිවරණයට ඉදිරිපත් වීමට ඉල්ලා අස් වූ බව ද දක්වා 07/2004 අංක දරණ චක්‍රලේඛය ප්‍රකාරව තම විශ්‍රාම වැටුප ඉල්ලා සිටින ලද බවය.

2009 වසරේදී පැමිණිලිකරු එය අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් වෙත ඉදිරිපත් කර ඇති බවද දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් එම ඉල්ලීම විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලද බවද

පැමිණිලිකරුගේ ඉල්ලීම සලකා බැලීමට පෞද්ගලික ලිපි ගොනුව අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නොමැති බැවින් පැමිණිලිකරුගේ අභියාචනය සලකා බලා එවකට රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය විසින් අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කර 2011.05.10 දින එය සලකා බලා එක්

වරකට පමණක් රු.75,000/-ක සානුකම්පිත දීමනාවක් ගෙවීමට 2011.06.23 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මගින් දැනුම්දී ඇති බවත් එම මුදල පමණක් 2011.07.07 දින පැමිණිලිකරුට ගෙවන ලද බවය.

**පරීක්ෂණයේදී අනාවරණය කරගත් කරුණු :**

2019.06.21 දින ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේදී කරන ලද පරීක්ෂණයේදී දීර්ඝ වශයෙන් පැමිණිලිකරු තම ඉල්ලීම සහ සහනය නොලැබීයාම ද අදාල වන රාජ්‍ය ආයතන විශාල සංඛ්‍යාවකට තම ඉල්ලීම හා අභියාචනා සලකා බලන ලෙස දන්වා තිබුණද තවදුරටත් මෙම සහනය නොලැබී තිබීම පිළිබඳව ද එයට හේතු වූ දේශපාලනික සහ විධායක හා පරිපාලන අංශ තුළින් සිදුවූ අසාධාරණය ද පිළිබඳ වාචිකව දක්වා පසුව ලිඛිත දේශනයක් මගින් සියළු කරුණු ඇමුණුම් සහිතව දක්වා තිබිණ. තම ලිඛිත දේශනය පිටු 08කින් සහ ඇමුණුම් 31ක් සහිත වූ අතර ඒ වනවිට පැමිණිලිකරු වයස අවුරුදු 91ක ජ්‍යෙෂ්ඨ පුරවැසියෙකු ද විය. වසර දහයක් පමණ කාලයක සිට තම සහනය නොලැබී තිබීම පිළිබඳව ඔහු කරුණු දක්වා 07/2004 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව තමාට හිමි විශ්‍රාම වැටුප අහිමි කර තිබීම ද මේ පිළිබඳ කරුණු සොයා බැලූ කමිටුව සිදු කර ඇත්තේ, විශ්‍රාම වැටුප වෙනුවට දීමනාවක් ගෙවියයුතු බවට වන නිර්දේශය අනුව රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම් විසින් දීමනාවක් කැබිනට් අනුමැතිය මත ලබාදීම සිදු කළද චක්‍රලේඛීය ප්‍රතිපාදනය උල්ලංඝනය කළ නොහැකි බවට පැමිණිලිකරු කරුණු දක්වන ලදී.

**නිරීක්ෂණ හා නිගමන :**

- මෙම පැමිණිලිකරු දැනට අවුරුදු 93ක් පමණ වූ ජ්‍යෙෂ්ඨ පුරවැසියෙකි. 1948 වසරට පෙර ඉංග්‍රීසි පාලන සමය පැවති යුගයේ එම සුදු අධිරාජ්‍ය විරෝධී ශිෂ්‍ය ව්‍යාපාරයේ ද එක් ක්‍රියාකාරිකයෙකු වූ පැමිණිලිකරු 1960 වසරේද මහ මැතිවරණයට ඉදිරිපත් වීම සඳහා රාජ්‍ය සේවයෙන් ඉල්ලා අස් වී ඇති අයෙකු බව නිරීක්ෂණය වේ. මහ මැතිවරණයෙන් ලද ඡන්ද ප්‍රතිඵල මත පාර්ලිමේන්තුව නියෝජනය කිරීමට අවස්ථාව ඔහුට අහිමිව තිබූ පසු රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 07/2004 අනුව තමා රාජ්‍ය සේවයේ යෙදී සිටි කාලයට අදාළව විශ්‍රාම වැටුප් ඉල්ලා ඇතත් එය ලබා නොදී රු.75,000/-ක සානුකම්පිත දීමනාවක් පමණක් ගෙවීම පැමිණිලිකරුගේ මෙම ගැටළුවට ප්‍රධාන හේතුව වී ඇත.

  දේශපාලන අයිතිවාසිකම් භුක්ති විඳීම (ආයතන සංග්‍රහයේ xxxii වැනි පරිච්ඡේදයේ I වන වගන්තිය සංශෝධනය කිරීමට අදාළ 07/2004 චක්‍රලේඛයේ 03 වන වගන්තියට අනුව ඇත්තේ.

  "මැතිවරණ වලට ඉදිරිපත් වීම සඳහා ඉල්ලා අස්වී ඇති 10 වසරක විශ්‍රාම වැටුප් සහිත සේවා කාලයක් ඇති නිලධාරීන්ට එම විධිවිධාන යටතේ විශ්‍රාම වැටුප් හිමිකම ලබාදීම සඳහා ඔහුගේ

ඉල්ලා අස්වීමේ ලිපි විශ්‍රාම ගැන්වීමට කරන ලද ඉල්ලීම් සේ සලකා ක්‍රියා කරනු ලැබේ " යන ලෙස ය.

2017.06.14 දින අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් විසින් තම අංක අනු/දිලේ/2/11(7) අනුව රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම් අමතා යවන ලද වාර්තාව මෙහිදී ඉතා වැදගත් එකක් බව පෙනී යයි. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 121 හි 5:4 වගන්තිය ප්‍රකාරව පැවැත්වූ කමිටු වාර්තාව ඉන් දැක්වේ. පැමිණිලිකරුට විශ්‍රාම වැටුප් ගෙවීම සලකා බැලීමට මෙම කමිටුව සිදුකල පරීක්ෂණයේ අවසන් තීරණය ඉන් දක්වා තිබේ. එයට අනුව.

- අනුරාධපුර දිස්ත්‍රික් ලේකම්ගේ අංක අනු/දිලේ/2/11(7) හා 2017.03.15 දිනැති ලිපිය අනුව මෙම කමිටුව පරීක්ෂණ සිදු කර ඇති බව නිරීක්ෂණය වේ.

- 1948.01.09 දින පැමිණිලිකරු රාජ්‍ය සේවයට ඇතුලත් වූ බවද, 1960.01.01 දින දක්වා සේවය කර ඇති බවද 1960 මාර්තු 19 දින පැවති මහ මැතිවරණයට ඉදිරිපත් වීමට රාජ්‍ය සේවයෙන් පැමිණිලිකරු ඉල්ලා අස්වී ඇති බවද දීර්ඝ වශයෙන් ලේඛන සහ තොරතුරු අධීක්ෂණය කර පරීක්ෂණ මණ්ඩලය විසින් තීරණය කර ඇත.

- 1988/89 කාලය තුල රට පුරා තිබූ භීෂණ සමයේ ඉපලෝගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයද ගිනි තබා විනාශ වී යාම මත පැමිණිලිකරුගේ පුද්ගලික ලිපි ගොනුව විනාශ වී ඇති බවටද හදුනාගෙන ඇත. එම පුද්ගලික ලිපි ගොනුව විනාශ වී ඇත්තේ පැමිණිලිකරුගේ අවශ්‍යතාවයකට නොවන බැවින් ඊට ඔහු වගකිවයුතු අයෙකු නොවන බව මෙහිදී නිරීක්ෂණය වේ. නියමිත ලේඛන ක්‍රමවත්ව පවත්වාගෙන ගිය පැමිණිලකරු සතු සියළු ලේඛන අධීක්ෂණය කළ මෙම කමිටුව තම වාර්තාවේ දක්වා ඇත්තේ එකී ලේඛන සත්‍ය බවට පිළිගතහැකි පරිදි අධීක්ෂණය කර තහවුරු කරගත් බවද ඒ අනුව පැමිණිලිකරු විශ්‍රාම ගැනීමට අවශ්‍ය වසර 10ක සතුටුදායක කාලය සපුරා ඇති බවය.

මෙහිදී රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 පදනම් කරගෙන 2006.01.01 දිනට වූ වැටුප පදනම් කරගෙන මාසික දීමනාවක් රු.131,280/- බැගින් ගෙවීමටද 2017 ජනවාරි මස සිට එය ගෙවීමට සුදුසු බවද සානුකම්පිත දීමනාව ලෙස ලබාදුන් රු75,000/-ක මුදල හිග විශ්‍රාම වැටුප හා පාරිතෝෂිකයක් ලෙස සැලකියයුතු බව ද තීරණය කර ඇත. පැමිණිලිකරුගේ වයස ද රෝගී තත්ත්වය ද මෙහිදී පරීක්ෂණ මණ්ඩලයේ ප්‍රධාන අවධානයට ද යොමුව ඇත. ඉපලෝගම ප්‍රාදේශීය ලේකම් ද දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ගණකාධිකාරී හා විශ්‍රාම වැටුප් නිලධාරී සහිත මෙම පරීක්ෂණ මණ්ඩලයේ නිර්දේශය ප්‍රකාරව කටයුතු සිදු නොවී තිබමෙන් දැනට වයස අවුරුදු 93ක් පමණ වූ පැමිණිලිකරුගේ මානසික තත්ත්වය තව තවත් හිංසනයට ලක්ව ඇති බවද නිරීක්ෂණය වන්නේ මෙම වයස පිළිබඳව නොසලකා හරිමින් ඔහු කරන ලද අභියාචනා තුළ අන්තර්ගත කරුණු දෙස බැලීමෙනි. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 121හි 5:4 වගන්තිය ප්‍රකාරව අනුරාධපුර දිස්ත්‍රික් ලේකම්ගේ 2017.06.14 දිනැති අංක අනු/දිලේ/11(1) සඳහන් කමිටුවේ නිර්දේශය ප්‍රකාරව සිදු කළයුතුව තිබියදී ක්‍රියාත්මක නොකර හැර තිබීමෙන් පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කර ඇති බව නිරීක්ෂණය වේ.

ඒ අනුව වගඋත්තරකරුවන්ගේ ක්‍රියා කලාපය මත පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වන අතර එය 1978 නව ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 12(1) ව්‍යවස්ථාව උල්ලංඝනය කිරීමක් බව නිගමනය කරනු ලැබේ.

**නිර්දේශය :**

වගඋත්තරකරුවන් විසින් පහත සඳහන් නිර්දේශයන් ක්‍රියාත්මක කිරීමට කටයුතු කළයුතු ය.

1. පැමිණිලිකරුට 07/2004 චක්‍රලේඛය ප්‍රකාරව හිමිවිය යුතුව තිබූ විශ්‍රාම වැටුප ඉතා කඩිනමින් ලබාදීමට පියවර ගතයුතු ය.

2. විශ්‍රාම වැටුප ගණනය කිරීමේදී විශ්‍රාම වැටුප හිමිවියයුතුව තිබූ නියමිත දින සිට ඊට අදාලව ලැබියයුතු හිඟ විශ්‍රාම වැටුප සහ ඊට අදාළ වෙනත් දීමනා ද සමග කඩිනමින් ලබාදීමට පියවර ගතයුතු ය.

2021.12.31 වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත නිර්දේශ කරනු ලැබේ.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින් ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දීමට කටයුතු කළයුතු අතර එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බව ද වැඩිදුරටත් දන්වමු.

A. Shanmuganathan

අනුසූයා ෂන්මුගනාදන්.
කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

දි/-ඩෑ

Ms. Anusuya Shanmuganathan
Commissioner
Human Rights Commissioner of Sri Lanka

ම.හේ.නිමල් කරුණාසිරි.
කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Dr. M. H. Nimal Karunasiri
Commissioner
Human Rights Commission of Sri Lanka